# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,162 - 2020 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා - 2020.02.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 652 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 655 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 661 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - දූදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 පෙබරවාරි මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවි පංතියට අයත් නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය**

පහත විස්තර කර ඇති ඉඩම සඳහා ඉල්ලුම්පත් සලකා බැලීමට සහ එම ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2020.05.14 දින පෙ.ව. 9.00ට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* දිස්ත්‍රික්කය : පුත්තලම

*(ආ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : වනාතවිල්ලුව

*(ඇ)* ග්‍රාම නිලධාරි වසම : 637 වට්ටකණ්ඩල්
637/1 මයිලන්කුලම
635/3 සේරක්කුලිය
635 පරණ එළුවන්කුලම
636/2 වනාතවිල්ලුව උතුර
636/6 මංගලපුර
635/4 කරතිව් උතුර
636/3 විජයපුර බටහිර
636/4 විජයපුර නැගෙනහිර
636 කරතිව් දකුණ
636/5 බණ්ඩාරනායකපුර
636/1 වනාතවිල්ලුව දකුණ
637/2 සමගිපුර
637/3 කරඩිපුවල්
635/1 අළුත් එළුවන්කුලම
635/2 රාල්මඩුව

*(ඉ)* ඉඩමේ නම : වට්ටකණ්ඩල්, මයිලන්කුලම, කරඩිපුවල්, වනාතවිල්ලුව, එළුවන්කුලම, කරඩිපුවල්
*(ඊ)* ඉඩමේ විස්තරය :-
*(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරිමාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති) : වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩ ඉඩම.
*(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය : කෘෂිකාර්මික කටයුතු සඳහා රූඩ් 02 සිට අක් 03 දක්වා

2. පහත සඳහන් පන්තිවලට අයත් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

* කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන ඉ. කො. 157 ලේඛනයේ ලියාපදිංචි වූ රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් ලබාගැනීමට සුදුසු ආදායම් කාණ්ඩයට අයත් අය.

3. සියළුම ඉල්ලුම්පත්‍ර 2019.04.27 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම් වනාතවිල්ලුව වෙත ලැබිය යුතුය. සියළුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2020 මැයි 14 දින පෙ.ව. 9.00 ට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ *නැතහොත්* තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියළුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරන වෙනත් අදාල තොරතුරු ඉඩම් කච්චේරියේ ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. තෝරා ගනු ලබන සෑම අයදුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ අවසර පත්‍රයක් ලැබෙන අතර එය, එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරා ගනු ලැබී ඇත්තේ කවර ඉඩමක් සඳහා ද ඒ ඉඩම වෙනුවෙන් පර්චස් එකකට රු. 150 ක් බැගින් ගණන් බලනු මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව සඳහා ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මිලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් හා ඔවුන්ගේ නම ඉදිරියෙන් ඇති ස්ථාන වලින්ද ලබාගත හැක.

* ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වනාතවිල්ලුව.
* සහකාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වනාතවිල්ලුව.
* ජනපද නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වනාතවිල්ලුව.

එම්. ඒ. බී. සී. ආලෝක බණ්ඩාර,
ඉඩම් කොමසාරිස් (වයඹ).

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කටයුතු සඳහා ඉඩම් ලබා දීමට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ................ යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :...........................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

3. *(a)* ලිපිනය :..........................................................................................................

*(b)* ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :.................................................................

*(c)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................................................................

4. ගෘහ මූලික අංකය :..........................................................................................................

5. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................................................

6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :..........................................................................

7. උපන් දිනය :..........................................................................................................

8. විවාහක/අවිවාහක :..........................................................................................................

9. රැකියාව :..........................................................................................................

10. රැකියාව කරන ස්ථානය :..........................................................................................

11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම* |
|---|---|---|---|
| | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර.-

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | පවුලේ පළවෙනි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :..............................................................................................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :- (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග) :...............................................

15. නිවස පිහිටි ස්ථානය :..............................................................................................................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :..............................................................................................................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/විද්‍යාලයේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද ? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න.

i. ලබාගත් ණය මුදල :..............................................................................................................................................................
ii. ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :................................................................................................................
iii. දැනට ගෙවීමට ඇති ශේෂය :.................................................................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේද ? තිබේ නම් පහත විස්තර සපයන්න.

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| | | |
| | | |

20. ඉඩම් ලාභියෙකු වශයෙන් යථා කාලයේදී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟවන අතර, ඉඩම් බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුවද අසත්‍යයක් බව හෙළිවුවහොත් මාගේ තෝරාගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................................

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

..............................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :................................................................................
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.........................................

අනු අත්සන් කරමි.

...............................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :....................................................................
ලිපිනය :..............................................................

**දිවුරුම් ප්‍රකාශය**

පුත්තලම දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........................................................................ ග්‍රාම නිලධාරි වසමේ පදිංචි ........................................................................................................................ වන මම, පහත පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මටද මාගේ කලත්‍රයාටද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ටද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම සහ පෞද්ගලික ඉඩම ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, ඉහත කී අක්කර ..................... රූඩ් ................... පර්. ..................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිලදී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් සහතික කරමි.

..........................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

.................................................,
සාමදාන විනිශ්චයකාර තැන.

02-85

# තනතුරු - ඇබෑර්තු

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ජීව වෛද්‍ය ඉංජිනේරු III ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීම - 2020 (විවෘත)**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ජීව වෛද්‍ය ඉංජිනේරු III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වැටුප් පරිමාණය.-*

වැටුප් කේත අංකය SL - 1 - 2016 වන අතර මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච.03/2016 අනුව රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 -රු. 110,895 /- (01 වන වැටුප් පියවර)

03. *සේවා කොන්දේසි.-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම තනතුරට බඳවාගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iii) තනතුරට බඳවා ගැනීමෙන් පසු ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත් විය යුතුය.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ මුල්‍ය රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට *නොහොත්* නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

04. *පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්.-*

ජීව වෛද්‍ය නිලධාරි තනතුරේ පුරප්පාඩු 01 ක් පවතී. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2020.03.06 දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2020.03.06 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

05. *සුදුසුකම්.-*

5.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යුත්/ විදුලි/ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව / ජීව වෛද්‍ය ඉංජිනේරු පිළිබඳ උපාධියක් ලබා තිබීම.

5.2 පළපුරුද්ද :

රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයක ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකු, සායනික ඉංජිනේරුවරයෙකු හෝ වෛද්‍ය විද්‍යාඥයෙකු වශයෙන් සේවය කර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

5.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.4 වෙනත් සුදුසුකම් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් අවම වශයෙන් අඛණ්ඩව වසර 03ක වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

iii. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් 2020.03.06 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

06. *වයස් සීමාව.-*

අවම සීමාව : අවුරුදු 21
උපරිම සීමාව : අවුරුදු 35

07. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ මත හා පුරප්පාඩු සංඛ්‍යාව අනුව මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ. ලකුණු ලබාදීමක් සිදු නොකරයි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ මත හා පුරප්පාඩු සංඛ්‍යාව අනුව මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්.-*

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| i. *අතිරේක පශ්චාත් අධ්‍යාපන සුදුසුකම් :*<br><br>a. පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යුත් / විදුලි / යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව / ජීව වෛද්‍ය ඉංජිනේරු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් - 15<br>b. සායනික ඉංජිනේරු විද්‍යාව / වෛද්‍ය ඉලෙක්ට්‍රොනික් විද්‍යාව /වෛද්‍ය තාක්ෂණ කළමනාකරණය / වෛද්‍ය භෞතික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් - 15 | 30 |
| ii. *පළපුරුද්ද :*<br><br>රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයක ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකු, සායනික ඉංජිනේරුවරයෙකු හෝ වෛද්‍ය විද්‍යාඥයෙකු වශයෙන් සේවය කිරීම වෙනුවෙන් එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 08ක් සඳහා | 40 |
| iii. *ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ප්‍රකාශන :*<br><br>ක්ෂේත්‍රයට අදාළව ( විද්‍යුත් / විදුලි / යාන්ත්‍රික ඉංජිනේරු / ජීව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාවන්) ප්‍රසිද්ධ කරන ලද (ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයෙන් අංකයක් ලබාගත් / පිළිගත් ජ'නලයක පළකරන ලද (principle author ලෙස) පර්යේෂණ හා ප්‍රකාශන එකකට ලකුණු 05 බැගින් (උපරිම ලකුණු 25) | 25 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 |
| මුළු ලකුණු | 100 |

08. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

8.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමු පිටුවට ද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙළ කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8.2 කරන ලද අයදුම්පත්‍රය 2020.03.06 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "**ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය**" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ජීව වෛද්‍ය ඉංජිනේරු III ශ්‍රේණියට බඳවා ගැනීම - 2020 (විවෘත)**" යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත්‍රය අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, (රු. 498,960/-ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු)බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද සහතික කරවා ගත යුතු ය.

09. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්වන අයුරින් සෑම අයදුම්කරුවෙක්ම සම්මුඛ පරීක්ෂණයේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරදී හෝ සම්මුඛ පරීක්ණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

11. මෙම සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

12. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

13. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලු අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී සම්මුඛ පරීක්ෂණ ලිපි නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්කරුවෙකුට සම්මුඛ පරීක්ෂණයට කැඳවීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

14. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

15. මෙම *ගැසට්* නිවේදනය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

තිලක් සෙනරත්,
ලේකම්.

2020 ජනවාරි මස 27 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ජීව වෛද්‍ය ඉංජිනේරු III ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීම - 2020**

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

01.
1.1 මුලකුරු සමග නම : ..........................................................................................................
1.2 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ............................................................................
1.3 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ........................................................................
1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................................

02.
2.1 ස්ථිර ලිපිනය (සිංහල/දෙමළෙන්) : ..................................................................................
..........................................................................................................................................
2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) : ......................................................................
..........................................................................................................................................
2.3 සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය : .......................................................
..........................................................................................................................................
2.4 දුරකථන අංකය : ..............................................................................................................

03.
3.1 බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය : ඇත / නැත

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2020.03.06 වැනි දිනට අදාළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය :

වර්ෂ : [ ] මාස : [ ] දින : [ ]

3.3 උපන් දිනය : වර්ෂය : [ ] මාසය : [ ] දිනය : [ ]

3.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2020.03.06 වැනි දිනට වයස.-

වර්ෂ : [ ] මාස : [ ] දින : [ ]

3.5 ස්ත්‍රී / පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

04.
*සුදුසුකම්.-* (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 05 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාල සුදුසුකම් දැක්විය යුතු අතර ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

4.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(i) හදාරා ඇති උපාධිය : ..................................................

(ii) හදාරා ඇති විෂයයන් : ..................................................

(iii) විශ්ව විද්‍යාලය : ..................................................

(iv) සාමාර්ථය : ..................................................

(v) සහතිකය වලංගු වන දිනය : ..................................................

4.2 *පළපුරුද්ද :*

| ආයතනයේ නම (රාජ්‍ය/පළාත් රාජ්‍ය/ ව්‍යවස්ථාපිත මණ්ඩලය/වෙනත් පෞද්ගලික ආයතනයක්) | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |

.................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරව දනිමි. තවද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..........................................;
අයදුම්කරුගේ අත්සන.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු /ඇය .......................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

දිනය :..........................................

..........................................;
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිලමුද්‍රාව.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :..........................................
තනතුර හා ලිපිනය :..........................................

මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, රු. 240,360/- වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුයි.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
(අනවශ්‍ය වචන කපා හරින්න.)

..........................................මයා/මිය/මෙනෙවිය .................................................. අමාතත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .................................................. වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහු /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය / ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

..........................................;
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිලමුද්‍රාව තබන්න.)

දිනය :..........................................
සහතික කරන නිලධාරියාගේ නම :..........................................
තනතුර :..........................................
ලිපිනය :..........................................

02-212

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2020 (විවෘත)**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාතේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

02. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.පරි.ච. 06/2006 අනුව රු. 15,215-10×215-4×240-7×320×15×360-25,965/- වේ. වැටුප් කේත අංකය MN-4-2006A වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි උපලේඛණ IV හි සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

03. *සේවා කොන්දේසි.-*

අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

04. *පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්.-*

ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරේ පුරප්පාඩු 11 ක් පවතී. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2020.03.06 දින වේ. අයදුම් කරන තනතුරට අදාල සියලු සුදුසුකම් 2020.03.06 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

05. *සුදුසුකම් :*

5.1. *අධ්‍යාපන සුදුසුකම්.-*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම

5.2. *කායික සුදුසුකම්.-*

සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.3. *වෙනත්.-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතුය.
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත ඉහත සඳහන් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. *වයස් සීමාව :*

අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි

07. *විභාගය පිළිබඳ විස්තර :*

| *ප්‍රශ්න පත්‍රය/ විෂයය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

08. *විභාගය සඳහා විෂයය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන හැකියාව, ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| 2. සාමාන්‍ය දැනීම | ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික, විද්‍යාත්මක හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |

09. *විභාග ගාස්තු.-*

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600/- කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

10. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ආ)* අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

*(ඇ)* සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2020.03.06 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්,බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය"** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරීන් සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය-2020"** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*(ඈ)* අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 07 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

(ඉ) අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. අයදුම්කරුවන් අත්සන සාමදාන විනිශ්චකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, (රු.498,960/-ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, හෝ යන මොවුන්ගෙන් කවරකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

11. *විභාගයට ඇතුල්වීම :*

*(අ)* නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලු අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*(ආ)* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

14. *විභාග ක්‍රමය :*

(i) අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
(ii) මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයක දී පවත්වනු ලැබේ.

15. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් විවෘත ධාරාව යටතේ 60% බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර තනතුරට බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීමට පමණක් මෙය පවත්වනු ලැබේ.

16. මෙම විභාගවලින් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

17. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

18. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

20. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

තිලක් සෙනරත්,
ලේකම්.

2020 ජනවාරි මස 28 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

### ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2020 (විවෘත)*

විභාග අංකය : [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T  [ ]
ඉංග්‍රීසි - E

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................

(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................

..........................................................................................

(උදා. : H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................

..........................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................

..........................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................

..........................................................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ෘ

i. සිංහලෙන්/ දෙමළෙන් ෘ.................................................................

.................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ෘ.................................................................

.................................................................

2.4 දුරකථන අංකය ෘ

| ස්ථාවර ෘ | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම ෘ | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියලු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

03. 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

ස්ත්‍රී - ☐ පුරුෂ - ☐

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ෘ- .................................................................

3.3 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව ෘ- .................................................................

04. 4.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

විවාහක ෘ ☐ අවිවාහක ෘ ☐

4.2 උපන් දිනය ෘ- වර්ෂය ෘ ☐☐☐☐ මාසය ෘ ☐☐ දිනය ෘ ☐☐

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ෘ අවුරුදු ෘ ☐☐ මාස ෘ ☐☐ දින ෘ ☐☐

05. *අධ්‍යාපන සුදුසුකම් ෘ-*

i. ලබා ඇති උපාධිය ෘ .................................................................
ii. උපාධියේදී හදාරණ ලද විෂයයන් ෘ .................................................................
iii. විශ්වවිද්‍යාලයේ නම ෘ .................................................................
උපාධි සහතිකය වලංගු දිනය ෘ .................................................................

06. ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -.................................................................
විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය - .................................................................
දිනය - .................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

07. *අයදුම්කරුගේ සහතිකය.-*

.................................................................
................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ

හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය :.......................... ...............................................,
අයදුම්කරුගේ අත්සන.

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................ මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය ........................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.......................................................,
අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :..........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :..........................................................................................
තනතුර :..........................................................................................
ලිපිනය :..........................................................................................

02-213

---

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2020 (විවෘත)

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වැටුප් පරිමාණය :*

වැටුප් කේත අංකය MN-3-2016 වන අතර මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.පරි.ච. 03/2016 අනුව රු. 31,040-10×445-11×660-10×730-10×750-57,550/- වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

03. *සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත්කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත්කරනු ඇත.

(iii) තනතුරට බඳවා ගැනීමෙන් පසු සමුපකාර සංවර්ධන නිලධාරින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත් විය යුතුය.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින්

පනවනු ලබන රෙගුලාසිවලට *නොහොත්* නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි *නොහොත්* නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

04. *පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :*

සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරේ පුරප්පාඩු 18 ක් පවතී. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2020.03.06 දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2020.03.06 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

05. *සුදුසුකම් :*

5.1. *අධ්‍යාපන සුදුසුකම්.-*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන් එකවර (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ එකවර විෂයන් 03 ක් සමත් වීම ප්‍රමාණවත් වේ.)

5.2. *කායික සුදුසුකම්.-*

සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.3. *වෙනත් සුදුසුකම්.-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් අවම වශයෙන් වසර 03ක වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(iii) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් 2020.03.06 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

5.4 *වෘත්තීය සුදුසුකම්.-*

(i) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණය පිළිබඳ වසර 01ක ඩිප්ලෝමාව සමත්ව තිබීම.

*හෝ*

(ii) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් විගණනය පිළිබඳ වසර 01ක ඩිප්ලෝමාව සමත්ව තිබීම.

*හෝ*

(iii) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් කළමනාකරණය පිළිබඳ වසර 01ක ඩිප්ලෝමාව සමත්ව තිබීම.

*හෝ*

(iv) ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම.

*හෝ*

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් වසර 01ක ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම.

*හෝ*

(vi) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් වසර 01ක කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම.

*හෝ*

(vii) ජාතික උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ වසර 04ක උසස් ඩිප්ලෝමාව සමත් වී තිබීම.

*හෝ*

(viii) ජාතික උසස් තාක්ෂණ ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ වසර 03ක උසස් ඩිප්ලෝමාව සමත් වී තිබීම.

*හෝ*

(ix) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

*හෝ*

(x) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

*හෝ*

(xi) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

06. *වයස් සීමාව :*

අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 30 (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.)

07. *විභාගය පිළිබඳ විස්තර :*

| *ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම හා විෂයානුබද්ධ දැනීම | පැය 01 | 100 | 40% |

08. *විභාගය සඳහා විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයෙන් ද, විශ්ලේෂණ හැකියාවන් ද, තීරණ ගැනීමේ ශක්තීන් ද විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. සාමාන්‍ය දැනීම හා විෂයානුබද්ධ දැනීම | *(අ)* ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික හා දේශපාලන දැනුම<br>*(ආ)* සමූපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම<br>බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. |

09. *විභාග ගාස්තු.-*

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.600/- කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

10. *අයදුම් කිරීමේ ක්‍රමය :*

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත්වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

(ඇ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2020.03.06 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය"** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020 (විවෘත)** "යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඈ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 07ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

(ඉ) අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. අයදුම්කරුවන් අත්සන සාමදාන විනිශ්චකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, (රු. 498,960/-ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද සහතික කරවා ගත යුතු ය.

11. *විභාගයට ඇතුළුවීම.-*

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලු අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දී ම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*(ආ)* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.-*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.-*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

14. *විභාග ක්‍රමය.-*

(i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලු ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
(ii) මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

15. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව විවෘත ධාරාව යටතේ බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර තනතුරට බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීමට පමණක් මෙය පවත්වනු ලැබේ.

16. මෙම විභාගවලින් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

17. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

18. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලු අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළකර ඇත.

20. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2020 ජනවාරි මස 27 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2020 (විවෘත)*

විභාග අංකය : ☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T ☐
ඉංග්‍රීසි - E

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................

(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................

..................................................

(උදා. : H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..................................................

..................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................

..................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..................................................

..................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/ දෙමළෙන් :..................................................

..................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..................................................

..................................................

2.4 දුරකථන අංකය :

ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐ ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

03. 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

ස්ත්‍රී - ☐ පුරුෂ - ☐

3.2 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3

☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ....................

3.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව :- ....................

04. 4.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

විවාහක : ☐ අවිවාහක : ☐

4.2 උපන් දිනය :- වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

05. *අධ්‍යාපන සුදුසුකම් :-*

5.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐

i. විභාගයේ වර්ෂය හා මාසය : ....................
ii. විභාග අංකය : ....................
iii. ප්‍රතිඵල :-

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 06 | | |
| 2 | | | 07 | | |
| 3 | | | 08 | | |
| 4 | | | 09 | | |
| 5 | | | 10 | | |

5.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐

i. විභාගයේ වර්ෂය හා මාසය : ....................
ii. විභාග අංකය : ....................
iii. ප්‍රතිඵල :-

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

06 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 5.4 අනුව ලබා ඇති වෘත්තීය සුදුසුකම් : ( නිවේදනයේ සඳහන් වෘත්තීය සුදුසුකම්වලට අදාළ අනු අංකය ඉදිරියෙන් සටහන් කරන්න.)

(උදා :- ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම IV )

i. .................................................... ☐

ii. .................................................... ☐

07. දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම්,

7.1 දැනට දරන තනතුර : ..........................................................................................

7.2 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ..........................................................................................

7.3 එම තනතුරට පත්වීමේ දිනය : ..........................................................................................

7.4 එම තනතුර ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න : ..........................................................................................

7.5 සේවය ස්ථිර කළ දිනය : ..........................................................................................

08. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) ඔව් : ☐ නැත : ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්නː ..........................................................................................

09. ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.-..........................................................................................
විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය.- ..........................................................................................
දිනය.- ..........................................................................................

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |

10. *අයදුම්කරුගේ සහතිකය :*

..........................................................................................
.......................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය :.......................... ..........................................;
අයදුම්කරුගේ අත්සන.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................................... මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය ................................ වැනි දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

..................................................;
අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය : ..........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :..........................................................................................
තනතුර :..........................................................................................
ලිපිනය : ..........................................................................................

12. **රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන................................................................................................................................ මයා/මිය/මෙනවිය දැනට ................................................................................................ කාර්යාලයේ / ආයතනයේ ............................... දින සිට මේ දක්වා ............................................................................................ (තනතුර) වශයෙන් ස්ථිර /තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද, ඔහුගේ /ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද/නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය : .......................................................................................................
සහතික කරන නිලධාරියාගේ නම : ...........................................................................................
තනතුර : .......................................................................................................
ලිපිනය : .......................................................................................................

02-211

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | රු. ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2020 වර්ෂය** | | | |
| පෙබරවාරි | 2020.02.07 | සිකුරාදා | 2020.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.02.14 | සිකුරාදා | 2020.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.02.20 | බ්‍රහස්පතින්දා | 2020.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.02.28 | සිකුරාදා | 2020.02.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2020.03.06 | සිකුරාදා | 2020.02.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2020.03.13 | සිකුරාදා | 2020.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.03.20 | සිකුරාදා | 2020.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.03.27 | සිකුරාදා | 2020.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2020.04.03 | සිකුරාදා | 2019.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.04.09 | බ්‍රහස්පතින්දා | 2019.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.04.17 | සිකුරාදා | 2020.04.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.04.24 | සිකුරාදා | 2020.04.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2020.04.30 | බ්‍රහස්පතින්දා | 2020.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.